# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2033/4 – 2017 අගෝස්තු 21 වැනි සඳුදා – 2017.08.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2017 අංක 194 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2016/ඩබ්ලිව්එස්/135.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:
සීඑච්අයි/එල්එන්ඩී.1/ඒකිව්යූඅයිඊ/5/71.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2017 අගෝස්තු මස 15 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.**– ප්‍රාදේශීය ලේකම්, හලාවත.

2. **ඉඩමේ විස්තරය.**– වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුන්නේශ්වරම් පත්තුවේ, මුන්නේශ්වරම් ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක පියු/සීඑච්එල්/2016/419 හා 2016.11.11 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් සහ ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

1A – G26103– 82 (2017/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

01. **කැබලි අක්ෂර 'අ' – ලුණුපිටිය වත්ත – ප්‍රමාණය: හෙක්. 0.2240ක් පමණ**

උතුරට: කනගසබේ රාජමනී හිමිකම් කියන ලුණුපිටියවත්ත; නැගෙනහිරට: මාර්ගය සහ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන ලුණුපිටියවත්ත; දකුණට: ඇළ මාර්ගය; බටහිරට: වෙල්ලයියා නාගේන්ද්‍රදේවි හිමිකම් කියන ලුණුපිටියවත්ත.

09 - 02

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2017 අංක 197 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2016/යූඩී/521.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:
කේඩීඑස්/කේජිකේ/4/9/2017/01/එල්ඒ.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2017 අගෝස්තු මස 15 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.**– ප්‍රාදේශීය ලේකම්, මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟවට කෝරළේ සුළු කොට්ඨාසයේ කටුකැලේ, කොට්ඨාස අංක 4 (බහිරවකන්ද) (මහනුවර මහ නගර සීමාව තුල) ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මහ/එම්එච්එන්/2017/136 හා 2017.06.20 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණවලින් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – වරි.අංක 187, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත – ප්‍රමාණය: හෙක්. 0.0115**

උතුරට: සිරිමාවෝ බණ්ඩාරනායක මාවත සහ ඇළ; නැගෙනහිරට: ඇළ; දකුණට: කැබලි අක්ෂර බී, සී. කේ. ජේ. එස්. කරුණාරත්න සහ තවත් අය හිමිකම් කියන එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මාවතේ වරි. අංක 274/4 සහ අජිත් ධම්මික අබේවික්‍රම හිමිකම් කියන සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ වරි. අංක 189; බටහිරට: අජිත් ධම්මික අබේවික්‍රම හිමිකම් කියන සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ වරි. අංක 189 සහ සිරිමාවෝ බණ්ඩාරනායක මාවත.

02. **කැබලි අක්ෂර 'බී'– වරි. අංක 274/4, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මාවත – ප්‍රමාණය: හෙක්. 0.0060**

උතුරට: කැබලි අක්ෂර ඒ සහ ඇළ; නැගෙනහිරට: ඇළ සහ කැබලි අක්ෂර සී; දකුණට: කැබලි අක්ෂර සී, සිමෙන්ති කාණුව සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස, අජිත් ධම්මික අබේවික්‍රම හිමිකම් කියන සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ වරි.අංක 189 සහ කැබලි අක්ෂර ඒ.

03. **කැබලි අක්ෂර 'සී' – ප්‍රමාණය: හෙක්. 0.0003**

උතුරට: කැබලි අක්ෂර බී සහ ඇළ; නැගෙනහිරට: ඇළ සහ කැබලි අක්ෂර ඩී; දකුණට: කැබලි අක්ෂර ඩී, හිමිකම් කියන අය නොදන්නා ඉඩම සහ සිමෙන්ති කාණුව; බටහිරට: සිමෙන්ති කාණුව, සී. කේ. ජේ. එස්. කරුණාරත්න සහ තවත් අය හිමිකම් කියන එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මාවතේ වරි.අංක 274/4 සහ කැබලි අක්ෂර බී.

04. **කැබලි අක්ෂර 'ඩී'– ඉඩමේ නම සොයාගත නොහැක – ප්‍රමාණය: හෙක්. 0.0034**

උතුරට: කැබලි අක්ෂර සී සහ ඇළ; නැගෙනහිරට: ඇළ සහ මහනුවර බස් නැවතුම්පල (ගුඩ් ෂෙඩ්); දකුණට: මහනුවර බස් නැවතුම්පල (ගුඩ් ෂෙඩ්) සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස, සිමෙන්ති කාණුව සහ කැබලි අක්ෂර සී.

09 - 03

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 පෙබරවාරි මස 07 වැනි දින අංක 1796/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2013 අංක 25 දරන ආඥාවේ කැබලි අක්ෂර 'ඒ' ලෙස සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි 1 වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2012/ඩබ්ලිව්එස්/196.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: බීඩී/ඊඑල්එල්/එල්එන්ඩී/1/ඒකිව්යූඑස්එන්/14.
2017 අගෝස්තු මස 15 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඹල්වෙල කෝරළේ සුළු කොට්ඨාසයේ, හෙට්ටිපොල 69 - ජී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, උඩ කුඹල්වෙල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ඒෆ්වීපී 27 හා 2014.11.29 දිනැති මූලික පිඹුරේ සවිස්තරව පෙන්නුම් කර ඇති පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අංක 1346 – අගුරුවෙලගොඩපතන – ප්‍රමාණය: හෙක්. 0.0500ක් පමණ**

උතුරට: කැබලි අංක 1347, කැබලි අංක නොයෙදූ මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අංක 1345; නැගෙනහිරට: කැබලි අංක 1345, 84 සහ 1348; දකුණට: කැබලි අංක 1348, 84 සහ 72; බටහිරට: කැබලි අංක 72,1347 සහ කැබලි අංක නොයෙදූ මාර්ගය (මා.සං.අ.).

02. **කැබලි අංක 1348 – කොලොන්ගස්හේනපතන – ප්‍රමාණය: හෙක්. 0.1018ක් පමණ**

උතුරට: කැබලි අංක 1346, 1345 සහ 84; නැගෙනහිරට: කැබලි අංක 84; දකුණට: කැබලි අංක 84 සහ 72; බටහිරට: කැබලි අංක 84, 72 සහ 1346.

09 - 04

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.